(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 69.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2021 අප්‍රේල් 20 අඟහරුවාදා පූ.භා. 10.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

36/2020

ගරු හේෂා විතානගේ මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති සහල් ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල;

(iii) ආනයනය කිරීමේදී සහල් කිලෝවක් සඳහා අයකරන ලද බදු මුදල;

(iv) සහල් ආනයනය සඳහා අය කරන ලද මුළු බදු මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත වර්ෂවලදී සහල් මිල උච්චාවචනය වූ ආකාරය පිළිබඳ පූර්ණ වාර්තාවක් එක් එක් වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

203/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික තරුණ සේවා සභාවේ නව අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජික/සාමාජිකාවගේ නම, ලිපිනය, අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) තරුණ සංවර්ධනය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ඉදිරි දැක්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

356/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර, නිල්වලා ගඟට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් එම ගඟ අපිරිසිදු වී ඇති බවත්;

(ii) මාතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට එය අහිතකර ලෙස බලපා ඇති බවත්;

(iii) ජලයේ ගුණාත්මක බව රැක ගැනීම පිණිස නිල්වලා ගඟ දෙපස රක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) නිල්වලා ගඟ දෙපස අඩි 33ක රක්ෂිත ප්‍රදේශයක් ස්ථාපනය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2016 වර්ෂය තුළ නිල්වලා ගඟට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

458/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අනුරාධපුර සිට කුරුණෑගල නගරයට ළඟාවිය හැකි කෙටිම මාර්ගය බුල්නෑව - පොල්පිතිගම මාර්ගය බවත්;

(ii) එම මාර්ගයේ තලාව හංදියේ සිට පොල්පිතිගම හංදිය දක්වා වූ කොටස මේ වනවිට අබලන් තත්ත්වයේ පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ග කොටස සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) එම සංවර්ධන කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

462/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු රජයේ ශික්ෂණ රෝහල රජයට පවරා ගනු ලැබූ දිනය කවරේද;

(ii) එම පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම රෝහලේ සමස්ත කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) එම රෝහලේ සේවය කරනු ලබන හෙදියන් සඳහා 2017 ඔක්තෝබර් සිට 2020 දෙසැම්බර් දක්වා ගෙවන ලද වැටුප්වල එකතුව කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රජය විසින් එම රෝහලට ඖෂධ සපයන්නේද;

(ii) එසේ නම්, 2017 සැප්තැම්බර් සිට මේ වනතෙක් එම ඖෂධ සැපයීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

539/2020

ගරු රෝහණ බංඩාර මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන අලි තර්ජනයට මුහුණ දී සිටින අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා අලි-මිනිස් ගැටුම හේතුවෙන් මිය ගිය පුද්ගලයන් සංඛ්‍යාව හා දේපළ හානි සිදුවීම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින අලි-මිනිස් ගැටුමට ස්ථිර විසඳුමක් ලබා දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

620/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍ය උපාධි ප්‍රදානය කරනු ලබන ජාත්‍යන්තර විශ්වවිද්‍යාල කිහිපයක් අසාදු ලේඛනයට ඇතුලත් කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එම විශ්වවිද්‍යාලවල නම් කවරේද;

(iii) එවැනි තීරණයක් ගැනීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඉහත (අ) (ii) හි සඳහන් විශ්වවිද්‍යාලවලින් උපාධි ලබාගත් ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

717/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ක්‍රීඩකයන් සංචිත ගත කර පුහුණුව ලබා දීම තුළින් සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකි බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා සංචිත සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංචිත පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා කවරේද;

(iii) මළල ක්‍රීඩාව සඳහා වන ජාතික සංචිතය පවත්වාගෙන යනු ලබන ස්ථානය කවරේද;

(iv) එම සංචිතයේ මේ වනවිට පුහුණුව ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව කොපමණද;

(v) එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ප්‍රමාණවත් පහසුකම් ලබා දී තිබේද;

(vi) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

753/2020

ගරු ශානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ සිට පොළොන්නරුව දක්වා ධාවනය කරනු ලබන දුම්රිය, මඩකලපුව දක්වා ධාවනය නොකිරීමට හේතු කවරේද;

(ii) මඩකළපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දුම්රිය මාර්ග පිළිසකර කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

763/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් වන —

(i) අධ්‍යාපන කොට්ඨාස සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) ජාතික පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iii) පළාත් පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) මෙම පාසල්වල මේ වනවිට පවතින ගුරු හිඟය කොපමණද;

(v) පසුගිය වර්ෂ 5 තුළ වැසී ගිය පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත්වන පාසල් අතරින්—

(i) අ.පො.ස. (උ/ පෙළ) සඳහා අදාළ වන විෂය ධාරා හතරක්, විෂය ධාරා තුනක්, විෂය ධාරා දෙකක් හා එක් විෂය ධාරාවක් පමණක්;

(ii) අ.පො.ස. (සා/ පෙළ) විභාගය දක්වා;

(iii) පහ ශ්‍රේණිය දක්වා;

ඉගැන්වීම් කටයුතු සිදුකරනු ලබන පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත්වන පාසල්වල සේවයේ නියුතු මුළු ගුරුවරුන්, උපාධිධාරී ගුරුවරුන්, පුහුණු ගුරුවරුන්, විද්‍යාපීඨ ගුරුවරුන් හා අනෙකුත් ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 සිට 8 දක්වා විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 1),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 2),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 3),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 4),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 5),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 5, 7 සහ 8 වගන්ති සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— සංශෝධිත (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 8 සහ 30 වගන්ති සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ ස්ටිකර සහ ස්ටිකර කළමනාකරණ පද්ධතිය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 01 දිනැති අංක 2208/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 01/2021 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 01 දිනැති අංක 2208/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 02/2021 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 11 දිනැති අංක 2214/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 12 දිනැති අංක 2210/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.03.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අධිකරණ අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 දෙසැම්බර් 23 දිනැති අංක 2207/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.03.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*12.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

1354/2020

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ සහ අග්‍රාමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන් සංඛ්‍යාව විධායක හා අනෙකුත් ශ්‍රේණි අනුව කොපමණද;

(iii) එම එක් එක් සේවකයා සඳහා ලබා දෙනු ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1355/2020

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජනාධිපති ලේකම් කාර්යාලයේ සහ ජනාධිපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන් සංඛ්‍යාව විධායක හා අනෙකුත් ශ්‍රේණි අනුව කොපමණද;

(iii) එම එක් එක් සේවකයා සඳහා ලබා දෙනු ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1388/2021

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුරාබදු අඥා පනත අනුව පොල් රා යනුවෙන් හඳුන්වන්නේ කවරක්ද;

(ii) පොල් රා සඳහා ප්‍රමිතිකරණයක් තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රමිතිකරණය කවරේද;

(iv) මහ රා යනුවෙන් හඳුන්වන්නේ කවරක්ද;

(v) මහ රා සඳහා ප්‍රමිතිකරණය කවරේද;

(vi) රා සහ මහ රාවල ප්‍රමිතිය හඳුනාගන්නා ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රා සහ මහ රාවල ප්‍රමිතිය තහවුරු කිරීමේ වගකීම පැවරෙන ආයතනය;

(ii) රා සහ මහ රාවල ප්‍රමිතිය තහවුරු කිරීමේ ක්‍රමවේදය;

කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1390/2021

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මත් වතුර හා විනාකිරි නිපදවීමේදී ජංගම දුරකථන බැටරි, යූරියා, කටු කම්බි සහ ඇමෝනියා ආදී ද්‍රව්‍ය භාවිතා හෝ මිශ්‍ර කරනු ලබන බව වාර්තා වී තිබේද;

(ii) 2018, 2019 සහ 2020 වර්ෂවල එසේ වාර්තා වී ඇති තොරතුරු කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් ද්‍රව්‍ය භාවිතයෙන් හෝ මිශ්‍ර කිරීමෙන් නිපදවනු ලබන රා හේතුවෙන් රජයට අයවිය යුතු බදු අහිමි වන්නේද;

(iv) එසේ නම්, බදු අහිමි වන ආකාරය කවරේද;

(v) ඉහත (i) හි සඳහන් ද්‍රව්‍ය භාවිතයෙන් හෝ මිශ්‍ර කිරීමෙන් නිපදවනු ලබන රා හඳුනාගැනීමට ක්‍රමවේදයක් තිබේද;

(vi) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(vii) ඉහත (i) හි සඳහන් ද්‍රව්‍ය භාවිතයෙන් හෝ මිශ්‍ර කිරීමෙන් නිපදවනු ලබන රා හඳුන්වනු ලබන නාමය කවරේද;

(viii) බාහිර අමුද්‍රව්‍ය, රා සමග මිශ්‍ර කිරීමේ අරමුණ කවරේද;

(ix) බාහිර අමුද්‍රව්‍ය මිශ්‍ර කර නිපදවනු ලබන රා භාවිතා කරන්නේ කුමක් සඳහාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විනාකිරි සහ අරක්කු නිපදවීමට භාවිතා කරනු ලබන රාවල ප්‍රමිතිය මනිනු ලබන ආකාරය කවරේද;

(ii) එසේ ප්‍රමිතිය මනිනු ලබන අවස්ථා කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1391/2021

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2019 හා 2020 වර්ෂවලදී —

(i) රා එකතු කිරීමේ බලපත්‍රලාභීන් විසින් එකතු කරන ලද මුළු රා ප්‍රමාණය;

(ii) එක් එක් බලපත්‍රලාභියා විසින් එකතු කරන ලද රා ප්‍රමාණය;

(iii) එක් එක් බලපත්‍රලාභියා විසින් එකතු කරන ලද රා ලබා දී ඇති පාර්ශ්වය; සහ

(iv) ලබා දී ඇති ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එකතු කරන ලද රා, රා එකතු කරන්නන් සනත්කයේ තබා ගැනීමට හැකි කාලය නීත්‍යානුකූල හා තාක්ෂණික ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ගස් මැදීමේ බලපත්‍ර ක්‍රමය ඉවත් කිරීමෙන් රා නියාමන ක්‍රියාවලියට බලපෑමක් සිදු වන්නේද;

(ii) එසේ නම්, එම ආකාරය කවරේද;

(iii) සීනි, යූරියා, ඇමෝනියා, ජංගම දුරකථන බැටරි, කටු කම්බි ආදී බාහිර ද්‍රව්‍ය භාවිතයෙන් හෝ මිශ්‍ර කිරීමෙන් රා නිපදවීම අවම කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) රා සඳහා ප්‍රමිතිකරණයක් නොමැති වීම හේතුවෙන් අධිකරණ කටයුතු හා රජයේ රාජකාරි අවස්ථාවන්හිදී ප්‍රමිතියෙන් තොර රා හඳුනාගනු ලබන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1419/2021

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට රජය විසින් ගෙවීමට ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර්වලින් කොපමණද;

(ii) එම විදේශීය ණය වෙනුවෙන් ගෙවීමට ඇති ණය හා පොලී වාරිකය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත විදේශීය ණය ලබාගත් වර්ෂය, මුළු ණය මුදල, ගෙවා ඇති ප්‍රමාණය, ගෙවීමට ඇති ප්‍රමාණය, ගෙවා අවසන් කිරීමට ඇති වර්ෂ සංඛ්‍යාව ණය ලබා ගත් එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) රාජ්‍ය නොවන අංශ විසින් ලබා ගත් මේ වනවිට ගෙවීමට ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර්වලින් කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1433/2021

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රා කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර වර්ගවල නම් සහ එම බලපත්‍රලාභීන්ගේ නම්;

(ii) රා එකතු කිරීම සඳහා බලපත්‍ර නිකුත් කර ඇති බලපත්‍රලාභීන්ගේ නම්;

(iii) ඒ අතරින් 2020.12.31 දිනට සක්‍රිය හා අක්‍රිය බලපත්‍රලාභීන්ගේ නම්, ලිපින හා දුරකථන අංක වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විනාකිරි නිෂ්පාදනයට බලපත්‍ර නිකුත් කර ඇති බලපත්‍රලාභීන්ගේ නම්;

(ii) ඒ අතරින් 2020.12.31 දිනට සක්‍රිය සහ අක්‍රිය බලපත්‍රලාභීන්ගේ නම්, ලිපින හා දුරකථන අංක වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) රා එකතු කිරීමට හෝ විනාකිරි නිෂ්පාදනය කිරීමට නිකුත් කරනු ලබන බලපත්‍ර අනුව—

(i) සන්තකයේ තබා ගත හැකි රා ප්‍රමාණය නිර්ණය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) සන්තකයේ තබා ගත හැකි රා ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඈ) සන්තකයේ තබා ගත හැකි රා ප්‍රමාණය නිර්ණය කිරීම, රා මැදීමට ගස් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර මත පදනම් වන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?